**දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය - 2013**

**-----------------------------------------------------**

දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා සං ස) අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ කටයුතු ,සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමටත්, පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කෙරේ. ජාතික මට්ටමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳ අදහස් දැක්වීම්වලින් මෙම වාර්තාව සමන්විත වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාල පරිච්ඡේදය**

**-------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව, 2013 – 2017 ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සපයා දීම සඳහා දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ජාතික මට්ටමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයයි. මන්දපෝෂණය සහ බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා, වඩා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවනු පිණිස මහජන සෞඛ්‍ය කාර්ය සාධන ප්‍රමිත ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 කට සමාන විශේෂ ගැනුම් හිමිකම් මිලියන 129.8 කි. 2013 ජූලි 01 දින ව්‍යාපෘති කටයුතු ආරම්භ වූ අතර 2018 සැප්තැම්බර් 30 දින වනවිට නිමකිරීමට නියමිතය.

**1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමේ සාරාංශයක් වන මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් යෝග්‍ය මුදල් රෙගුලාසි සහ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ තෝරාගැනීම හා යොදාගැනීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී.මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී.ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්,වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්,ද්‍රව්‍ය හා උපකරණ සෞඛ්‍ය අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව

(ඉ) ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව මුදල් රෙගුලාසි 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති මහා භාණ්ඩාගාරයේ අංක 233/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක අත්තිකාරම,එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌන පූර්ණයන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව සහ

(උ) මූල්‍ය ගිවිසුමේ දක්වා තිබූ මූල්‍ය සම්මුතීවලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

## 3. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක අත්තිකාරම, එම ගිණුමින් ආපසු ගැනීම්, එම ගිණුමට ඌන පූර්ණය කිරීම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව සහ

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

----------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

ව්‍යාපෘතිය විසින් සපයන ලද තොරතුරු අනුව සියලුම ප්‍රභවයන්ගෙන් ලද අරමුදල්වලින් එකතුව රු.92,994,584,162 ක් වූ වියදම්, සමාලෝචිත වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරා තිබුණි.2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී සියලුම අරමුදල් ප්‍රභවයන්ගෙන් ලද මුදල්වලින් දරන ලද වියදම පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| **විස්තරය** | **සියලුම අරමුදල් ප්‍රභවයන්ගෙන් ලද මුදල්වලින්2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දරන ලද වියදම** |
|---|---|
| | රු. |
| **ජා.සං.සංගමයේ සහභාගිත්වය** | |
| පුනාවර්තන වියදම් | |
| -පුද්ගල පඩිනඩි | 37,914,758,743 |
| -ගමන් වියදම් | 133,332,183 |
| -සේවාවන් | 2,684,174,058 |
| **ජා.ස.සංගමයේ නොවන සහභාගිත්වය** | |
| -පුනාවර්තන වියදම් | 34,827,053,099 |
| -ප්‍රාග්ධන වියදම් | 17,435,266,079 |
| එකතුව | **92,994,584,162** |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

----------------------

ලබා ගත හැකි වූ තොරතුරු අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යාපෘතිය සඳහා පවත්වාගෙන යනු ලබන අංක 73586 දරන අග්‍රිම අරමුදල් ගිණුම සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5 විගණන නිරීක්ෂණ

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2012 ජූලි 31 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රදාන පොදු කොන්දේසි ප්‍රකාශනයේ 4.09 වගන්තිය අනුව, ව්‍යාපෘතියේ මෙහෙයුම් සම්පත් සහ ව්‍යාපෘතියට අදාළ වියදම් ප්‍රමාණවත්ව පිළිඹිබු වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඒකාකාරීව යොදාගත් ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව භාවිතා කළ යුතුය.කෙසේ වෙතත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සියලුම ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් වලින් 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම රු.92,994,584,162 ක් නියෝජනය වන පරිදි ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවක් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි.

### 5.2 අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති කටයුතු සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අරමුදල් ඌනපූරණය කර නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ සහභාගීත්වය මත රු.40,732,264,993 ක් පුනරාවර්තන වියදම් දැරූ ලෙස දක්වා තිබුණි.තවද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව,ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබිය යුතු මුදල් වලින් දැරීම සඳහා පුනාවර්තන වැය විෂයයන් 05ට සහ ප්‍රාග්ධන වැය විෂයයන් 01ක් සඳහා රු.800,000,000 ක වෙන්කිරීමක් කර තිබුණි.කෙසේ වෙතත් එකී වැය විෂයයන් යටතේ ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල් වලින් රු.781,503,258 ක් වැය කර තිබුණි. අරමුදල් වෙන්කිරීම් සහ 2013 දෙසැම්බර් 31 දිනට වැය කරන ලද මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2013 වර්ෂය සඳහා වෙන්කළ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද වියදම් |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| **පුනාවර්තන වියදම්** | | |
| රෝහල් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය | 135.00 | 134.94 |
| මූලික රෝහල්වල තත්ත්ව කළමනාකරණ ඒකක ස්ථාපනය කිරීම | 10.00 | 1.35 |
| බෝ නොවන රෝග ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රාථමික මට්ටමේ ආරක්ෂණ රසායනාගාර සේවා ශක්තිමත් කිරීමේ වැඩසටහන | 200.00 | 190.61 |
| ජාතික ඩෙංගු පාලන වැඩසටහන් | 200.00 | 200.00 |
| ජාතික අභ්‍යන්තර ගිලන්වීමේ හා මරණයට පත්වීමේ වාර්තාකරණ (IMMR) පද්ධතිය ක්‍රියාත්මක කිරීම | 5.0 | 4.60 |
| **ප්‍රාග්ධන වියදම්:** | | |
| ත්‍රිපෝෂ වැඩසටහන | 250.00 | 250.00 |
| **එකතුව** | **800.00** | **781.50** |

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුනාවර්තන සහ ප්‍රාග්ධන වියදම් දැරීම පිණිස සියලුම අරමුදල් ප්‍රභවයන්ගෙන් එකතුව රු.94,972,264,000 ක වෙන්කිරීම් වාර්ෂික ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු බවත් එකතුව රු.1,977,679,838 ක ඉතිරිකිරීම් සමාලෝචිත වර්ෂය අවසානයේදී වාර්තා කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

**5.3 භෞතික කාර්ය සාධනය**

------------------------

මෙම වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් කර ඇති ආකාරයට 2013 දෙසැම්බර් 31 දිනට සියලුම අරමුදල් ප්‍රභවයන්ගෙන් ලද මුදල්වලින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රු.92,994,584,162 ක් උපයෝජනය කළ බව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ පෙන්වා ඇත. 2013 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමට අදාළව කරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ සමහරක් පහත පරිදි යළි ඉදිරිපත් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර ගිලන්වීමේ හා මරණයට පත්වීමේ වාර්තාකරණ (අයිඑම්එම්ආර්) පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශයේ වෛද්‍ය සංඛ්‍යා ලේඛන ඒකකයට රු.2,301,800 ක් පිරිවැය වූ පරිගණක 17 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රකාරව එකී කාර්යය සඳහා පරිගණක 6 ක් පමණක් ප්‍රමාණවත් විය.මීලදී ගත් පරිගණකවලින් 9ක් වෛද්‍ය සංඛ්‍යාලේඛන ඒකකය විසින් රඳවාගෙන අනෙකුත් පරිගණක 8 අමාත්‍යාංශයේ රෝහල් 6 ක් වෙත 2013 දෙසැම්බර් 31 දින මුදාහැර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ කාර්යයන්වලට අදාළ නොවන අළුතෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලක සිවිල් වැඩවලට අදාළ බිල්පත් නිරවුල් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.100,914,469 ක් වැය කර තිබුණි.

(ඇ) ත්‍රිපෝෂ නිෂ්පාදන කර්මාන්ත ශාලාව රජය සතු සමාගමක් විසින් කළමනාකරණය කරනු ලබන අතර එහි සියලුම නිෂ්පාදන සහ කර්මාන්ත ශාලා වියදම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දරනු ලැබේ.කර්මාන්තශාලාවේ මෙහෙයුම් වියදම් දැරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මාසිකව රු.3,000,000 ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වී තිබුණි.කෙසේ වෙතත් ප්‍රතිපූර්ණයන් සිදු කරන අවස්ථාවේදී දරන ලද වියදම් විස්තර යාවත්කාලීන ආකාරයෙන් සමාගම් විසින් පරිවයක් වශයෙන් සපයනු නොලැබේ.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2013 මාර්තු 08 දිනැති ලිපිය අනුව ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාවේ භාවිතය සඳහා එන්ජින් ධාරිතාව 3200 CC ක් වූ ඩබල් කැබ් රථ 2ක් මිලදීගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්,එක් රථයක් රු.6,000,000 බැගින් වූ පිරිවැයකට එන්ජින් ධාරිතාව 2500 CC ක්වූ ඩබල් කැබ් රථ 2ක් ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඉ) විගණනය විසින් සපයාගත් තොරතුරු අනුව,2014 ජූනි 30 දින වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන රෝහල් 39 න්, එක් රෝහලක පමණක්, ව්‍යාපෘතිය විසින් සැලසුම් කළ පහසුකම් මට්ටමේ පවතින හදිසි ප්‍රතිකාර ඒකක පවත්වා ගෙන ගොස් තිබුණි. තවද 2014 ජූනි 30 වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ රෝහල් 16 ක ගුණාත්මක කළමනාකරණ ඒකක සම්පූර්ණ ධාරිතාවයෙන් පවත්වා ගෙන ගොස් තිබුණි. තවද,2014 ජූනි 30 දින වන විට, අන්තර්ජාල පදනම් කරගත් තොරතුරු පද්ධතිය මඟින් රෝහල් 18ක් විසින් ගිලන්වීමේ හා මරණයට පත්වීම පිළිබඳ (IMMR) දත්ත සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යවා තිබුණි.